56

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී තෙවන වසර දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019 ජනවාරි/ පෙබරවාරි
ආර්ථික විද්‍යාව

# ECON 3241.03 - මූල්‍ය ආර්ථික විද්‍යාව

කාලය : පැය තුන (03) යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 80ක් හා අඛණ්ඩ ඇගයීම් සඳහා ලකුණු 20ක් ද වශයෙන් ලකුණු වෙන් කර ඇත.

## A – කොටස

**මෙම කොටසින් ඕනෑම ප්‍රශ්න දෙකකට (02) පිළිතුරු සපයන්න.**

01. i. වුවමනාවන්හි ද්විත්ව සමපාතය යනු කුමක්ද?

ii. මුදල්වලින් ඉටුකරන ප්‍රධාන කාර්යයන් මොනවාද? (ලකුණු 8 බැගින්)

02. මුදල් ළඟ තබාගන්නා ප්‍රධාන චේතනාවන් තුන මොනවාද? (ලකුණු 16 යි)

03. ෆිෂර්ගේ ගනුදෙනු ප්‍රවේශය සහ කේම්බ්‍රිජ් මුදල් ශේෂ ප්‍රවේශය අතර පවතින සමාන අසමානකම් මොනවාද? (ලකුණු 16 යි)

04. මිල්ටන් ෆ්‍රීඩ්මාන්ගේ මුදල් ප්‍රමාණවාදී විග්‍රහය විස්තර කරන්න. (ලකුණු 16 යි)

## B – කොටස

**මෙම කොටසින් ඕනෑම ප්‍රශ්න දෙකකට (02) පිළිතුරු සපයන්න**

05. i. ''මූල්‍ය වෙළෙඳපොළ තොරතුරුවල අසම්පූර්ණතාව අහිතකර වරණය හා සමාජ උපද්‍රවය කෙරෙහි බලපානු ලබයි'' පැහැදිලි කරන්න.

ii. මූල්‍ය පද්ධතියක අහිතකර වරණය ගැටලුව විසඳීම සඳහා භාවිත කරන උපකරණ පැහැදිලි කරන්න.

(ලකුණු 8 බැගින්)

06. i. මුදල් හා ප්‍රාග්ධන වෙළඳපොළ අතර පවතින වෙනස කුමක් ද? ඒවා එකිනෙකට අනුපූරක හෝ ආදේශක වන්නේ ද?

ii. ශ්‍රී ලංකාවේ භාවිත වන ප්‍රධාන මූල්‍ය වෙළෙඳපොළ උපකරණ පැහැදිලි කරමින් මූල්‍ය වෙළෙඳපොළ කාර්යයන්හි වර්තමාන ප්‍රවණතාවන් අගයන්න.

(ලකුණු 8 බැගිනි)

07. i. පොළී අනුපාතය තීරණය වීම පිළිබඳ ප්‍රධාන න්‍යායන් දෙකක් කෙටියෙන් සාකච්ඡා කරන්න.

ii. පොළී අනුපාතික පිළිබඳ අවදානම (Risk Structure) හා තත්ත්ව (Term Structure) ආකෘතිය තර්කානුකූලව විභාග කරන්න.

(ලකුණු 8 බැගිනි)

## C – කොටස

**මෙම කොටසින් ඕනෑම ප්‍රශ්නයකට (01) පිළිතුරු සපයන්න.**

08. මුදල් සැපයුමේ සංරචක පැහැදිලි කරන්න. ශ්‍රී ලංකාවේ මුදල් සැපයුමේ මෑතකාලීන ප්‍රවණතා මොනවාද?

(ලකුණු 16 යි)

09. ආර්ථික සංවර්ධනයේ දී මූල්‍ය පද්ධතියේ කාර්යභාරය කුමක්ද?

(ලකුණු 16 යි)

10. බැඳුම්කර නිකුත් කිරීම වැඩිදියුණු කිරීම සඳහා පසුගිය පස්වසර තුළ ශ්‍රී ලංකා රජය ගනු ලැබූ පියවර සහ එහි ප්‍රවණතාවන් පැහැදිලි කරන්න.

(ලකුණු 16 යි)

xxxxxxxxxxxxxxxxxx